විසර්ජන ශිර්ෂය 260 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පිළිබඳ

විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය

---

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

i. දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරිම.

ii. දිස්ත්‍රික්කයේ ආගමික හා සංස්කෘතික උරුමයන් සුරැකිමට කටයුතු කිරිම.

iii. දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරිමට අවශ්‍ය කටයුතු මෙහෙය වීම.

iv. රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකුලව දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු කරගෙන යෑම.

v. ප්‍රාදේශිය ලේකම් කාර්යාල අධීක්ෂණය හා පරිපාලන කටයුතු කිරිම.

vi. කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය.

vii. දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කටයුතු මෙහෙයවීම.

viii. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුල කරන කටයුතු මෙහෙයවීම.

ix. ගිනි අවි හා පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරිම.

x. ප්‍රාදේශිය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය කළමනාකරණ කටයුතු කිරිම.

xi. වත්කම් භාරකාරත්වය හා පාලනය තහවුරු කිරිම.

xii. ජාතික මට්ටමේ උත්සව සංවිධානය කිරිම.

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

i. නුවරඑළිය

ii. අඹගමුව

iii. වලපනේ

iv. කොත්මලේ

v. හඟුරන්කෙත

3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර තිබුණි.

4. ගිණුම්

4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.363,100,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.309,296,662 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරිවීම රු.53,803,338 ක් වූ අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 15 % ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | වාර්ෂික මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන | මුළු ශුද්ධ ප්‍රතිපදනය | තථ්‍ය වියදම (2010 දෙසැම්බර් 31 දිනට) | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට) | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු | රු | % |
| පුනරාවර්තන | 243,450,000 | 243,450.000 | 234,558,250 | 8,891,750 | 3.65 |
| මූලධන | 119,650,000 | 119,650,000 | 74,738,412 | 44,911,588 | 37.53 |
| එකතුව | 363,100,000 | 363,100,000 | 309,296,662 | 53,803,338 | |

4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

**(i)** විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංහ හා දෙපාර්තමේන්තු වෙතින් පහත සඳහන් පරිදි එකතුව රු1,520,195,189 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබූ අතර, ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශිර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව. | ලැබුණ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය 2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 002 | අග්‍රාමාත්‍ය කාර්යාලය. | 3,125 | - | 3,125 |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය. | 200,000 | 194,000 | 6,000 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 230,379 | 222,369 | 8,010 |

| | | | | |
|---|---|---|---|---|
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. | 917,674,953 | 640,723,333 | 276,951,620 |
| 106 | ආපදා කලමනාකරණ අමාත්‍යාංශය. | 5,719,860 | 5,391,538 | 328,322 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය. | 1,082,500 | 609,562 | 472,938 |
| 116 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය. | 261,686 | 261,686 | - |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය. | 157,000 | 107,500 | 49,500 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය. | 19,662,110 | 16,904,512 | 2,757,598 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය. | 4,040,214 | 2,865,585 | 1,174,629 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය. | 2,146,910 | 1,992,980 | 153,930 |
| 127 | කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය. | 132,000 | 96,777 | 35,223 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය. | 3,929,539 | 2,764,884 | 1,164,655 |
| 134 | ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය. | 32,250 | 20,340 | 11,910 |
| 140 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය. | 157,035 | 67,835 | 89,200 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය. | 590,260 | 112,051 | 478,209 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය. | 21,764,576 | 21,746,368 | 18,208 |
| 156 | යෞවන කටයුතු අමාතයාංශය | 1,422,851 | 1,407,407 | 15,444 |

| | | | | |
|---|---|---|---|---|
| 160 | පරිසර අමාත්‍යාංශය | 400,000 | 316,400 | 83,600 |
| 173 | රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 1,575,000 | 1,357,000 | 218,000 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව. | 5,579,995 | 5,313,697 | 266,298 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. | 700,000 | 668,838 | 31,162 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. | 3,750 | 3,520 | 230 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව. | 1,040,295 | 958,095 | 82,200 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව. | 1,806,755 | 1,693,967 | 112,788 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව. | 279,709,995 | 248,115,557 | 31,594,438 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 7,500,000 | 7,479,342 | 20,658 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව. | 6,660 | 6,615 | 45 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව. | 354,394 | 56,851 | 297,543 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව. | 1,477,877 | 969,865 | 508,012 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව. | 239,973,546 | 230,107,841 | 9,865,705 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව. | 546,128 | 540,788 | 5,340 |

| | | | | |
|---|---|---|---|---|
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව. | 100,000 | - | 100,000 |
| 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 28,010 | 24,825 | 3,185 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව. | 335,000 | 241,797 | 93,203 |
| | එකතුව | 1,520,425,568 | 1,193,392,394 | 327,033,174 |

(ii). ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ලද රු.14,318,535 ක ප්‍රතිපාදන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් අවසන් නොකල හින්දු ආගමික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා බෙදා හැරීම පිණිස කි.ග්‍රෑ.50 සිමෙන්ති මිටි 2810 ක් වෙනුවෙන් රු.2,065,350 ක් ද, තීන්ත ලීටර් 3660 ක් වෙනුවෙන් රු.1,658,301 ක් ද ගෙවා තිබුණද විගණන පරීක්ෂණ අවස්ථාව වු 2011 පෙබරවාරි 28 දින වන විට එකී ගෙවීම් සිදුකර පිළිවෙළින් දින 425 ක් හා 152 ක් ගතවී තිබුණද, එම තොග ගෙන්වා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(iii). නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකල ආගමික මධ්‍යස්ථාන සඳහා බෙදා හැරීම පිණිස මිලදී ගෙන තිබු සිමෙන්ති පිළිබඳ සිදුකල විගණන පරීක්ෂණ අනුව සම්පුර්ණයෙන්ම ඉදිකිරීම් නිම කර තිබූ හින්දු ආගමික මධ්‍යස්ථාන 05 ක් වෙනුවෙන් රු. 404,250 ක් වටිනා සිමෙන්ති මිටි 550 ක් බෙදා දී තිබු අතර, විගණනයට ලබාදුන් ලිඛිත ප්‍රකාශ අනුව එම සිමෙන්ති තොග අවභාවිතයට ගෙන තිබු බව අනාවරණය විය.

(iv). නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 4 ක ඉදිකිරීම් අවසන් නොකල හින්දු ආගමික මධ්‍යස්ථාන 31 ක් වෙනුවෙන් ලබා දී තිබු රු.1,694,175 ක් වටිනාකමැති සිමෙන්ති මිටි 2345 ක් පිළිබඳ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම ද්‍රව්‍ය තොග අවභාවිත තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය විය. එසේම එම බලප්‍රදේශයට අයත් වෙනත් හින්දු ආගමික මධ්‍යස්ථාන 12 ක් වෙනුවෙන් බෙදා හැර තිබුණු රු.490,245 ක් වටිනාකමැති සිමෙන්ති මිටි 660 ක් විගණන අවස්ථාව වන විටත් ප්‍රයෝජනයට නොගෙන කල් ඉකුත්ව කෝවිල් පරිශ්‍රයේ පැවතුණි.

(v). මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස්ගේ 2001 ජුලි 17 දිනැති මධ්‍යම පළාත් ආදායම් චක්‍රලේඛ අංක 01/2001 පරිදි සංවර්ධන යෝජනාවලට අදාල සිමෙන්ති මිලදී ගැනීම් වෙනුවෙන් අය කළ යුතු රු.55,271 ක පිරිවැටුම් බදු අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(vi). 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ 153 වගන්තිය ප්‍රකාරව 2009 දෙසැම්බර් 29 දින අංක 1170 දරන වවුචරයෙන් 105-2-11-3-2502 වැය විෂය යටතේ මිලයට ගත් පෞද්ගලික ආයතනයකින් පිරිකර මිලදී ගැනීම වෙනුවෙන් ගෙවා තිබු රු.210,525 ක මුදලකින් අය කළ යුතු රු.10,526 ක රඳවා ගැනීමේ බදු අය කර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(vii). හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2009 සහ 2010 වර්ෂ සඳහා වු රු.3,000,000 ක ප්‍රතිපාදන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආගමික මධ්‍යස්ථාන 28 ක ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා එක් ආගමික මධ්‍යස්ථානයක් වෙනුවෙන් රු.100,000 බැගින් මධ්‍යස්ථාන 8 ක් සඳහා වු රු.800,000 ක ප්‍රතිපාදන උපයෝගි කර ගෙන මිළදී ගන්නා ලද රු.527,830 ක් වටිනා සිමෙන්ති හා තීන්ත ඊට අදාල බෙදා දීමේ ලැයිස්තුවේ සඳහන් ආයතන වෙත ලැබී නොතිබු බව තහවුරු විය.

(viii). 2009 වර්ෂයේදි විවිධ සමිති වෙත බෙදා හැරීම සඳහා 105-2-1-5-2502 වැය විෂය යටතේ මිළදී ගෙන තිබු රු.666,450 ක් වටිනාකමින් යුතු සංගීත භාණ්ඩ හා පරිගණක උපාංග 2010 දෙසැම්බර් 20 දින වන විටත් අදාල සමිති වෙත බෙදා නොදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැළසුම් අංශයේ ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ix). 2009 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 105-02-2-2502(01) වැය විෂය යටතේ මිලට ගත් ප්ලාස්ටික් ඇසුරුම් 6063 ක් සඳහා රු.1,999,960 ක් 2009 නොවැම්බර් 18 දින ගෙවීම් කර තිබුණද, විගණන දිනය වු 2010 දෙසැම්බර් 15 දින වන විටත් රු.861,610 ක් වටිනාකමැති ප්ලාස්ටික් ඇසුරුම් 2639 ක් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත බෙදා දිමට පියවර නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුල පැවැති අතර, රු.270,900 ක වටිනාකමැති ඇසුරුම් 903 ක් වෙනුවෙන් 2009 දෙසැම්බර් 28 දින අදාල ආයතනය වෙත මුදල් ගෙවා තිබුණද, එම තොගය 2010 දෙසැම්බර් 15 දින වන විටත් ලැබි නොතිබුණි.

(x). ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ 2007 මාර්තු 26 දිනැති ගම නැගුම ජාතික සවිය ගිණුම් උපදෙස් අංක 01 දරන චක්‍රලේඛය අනුව පරිපාලන වියදම්, අදාල ව්‍යාපෘති අධීක්ෂණයෙන් බාහිර කාර්යන් හා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා යොදා නොගත යුතු බව දන්වා ඇතත් එකී නියමයන්ට පටහැනිව 105-2-11-3-2502 වැය විෂය යටතේ වතු මාර්ග සංවර්ධනය වෙනුවෙන් ලබාදී තිබු ප්‍රතිපාදනවලින් රු.513,121 ක් උපයෝගි කර ගෙන ප්‍රාග්ධන උපකරණ මිලදී ගෙන තිබුණි.

4.3 විගණනය හා විගණන විෂය පථය.
-------------------------------------
නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන වාර්තාව 2011 අගෝස්තු 08 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම
------------------------------------------------------------------------------------------------------------
විසර්ජන ගිණුම හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ
----------------------------------------------------------
2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශවල තත්ත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.13 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ සොයාගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම

-----------------------

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය | ගිණුමේ නම |
|---|---|
| 260 | විසර්ජන ගිණුම |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ඇප තැන්පතු | මු. රෙ. 891 | ලේඛන පවත්වා නොතිබුණි. |

(iii) සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 01 කට 2011 මාර්තු 31 දින වන විට ද පිලිතුරු සපයා නොතිබුණි.

(ආ) අයවැය විචලනය

--------------------

(i). ශීර්ෂ 260 යටතේ වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු. 400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii). වැය විෂයයන් 18 කට අදාලව රු.48,119,907 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබු අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 12% ත් 87% අතර පරාසයක පැවතුනි.

(ඇ) පොදු තැන්පත් ගිණුම

(i) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාල වර්ෂ 2 කට වැඩි රු. 25,752,679 ක් වූ තැන්පත් ශේෂ 245 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සදහා ලබා දි තිබුණු රු. 335,872 ක් වු මුදල් අදාල කාර්යය ඉටු නොකර තැන්පත් ගිණුමේ රදවා ගෙන තිබුණි.

(ඇ). රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසදුම් ප්‍රකාශය

විෂය අංක 26001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව එම දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 670,970 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

4.6 වත්කම් කළමනාකරණය

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවති කාලය | අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය /ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|
| වාහන | 04 | වර්ෂ 02 | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| වාහන | 04 | වර්ෂ 06 - 14 | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| ඩ්‍රිල් ස්ටැන්ඩ් | 01 | වර්ෂ 02 | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| Bosch වර්ගයේ ඩ්‍රිල් (වොට් 2800) | 01 | වර්ෂ 02 | -එම- |

| | | | |
|---|---|---|---|
| අභ්‍යන්තර දුරකථන | 272 | වර්ෂ 02 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| ජායා පිටපත් යන්ත්‍ර | 01 | වර්ෂ 02 | -එම- |
| Toshiba වර්ගයේ පරිගණක | 01 | වර්ෂ 02 | -එම- |
| ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටර් | 01 | වර්ෂ 02 | නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යලය |

(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව ඒකක ගණන | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ජේදය |
|---|---|---|---|---|
| | | | රු. | |
| (i) ඉඩම් | 01 | වෘත්තිය පුහුණු අධිකාරිය | 16,000,000 | 2007 සිට |
| (ii) ගොඩනැගිලි | 02 | මධ්‍යම පළාත් සභාව වෘත්තිය පුහුණු අධිකාරිය | සොයාගත නොහැක | 2010 සිට |

(ඇ) බේරුම් නොකළ බැරකම්

--------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.78,189 ක් වු අතර, එම බැරකම් වර්ෂ එකකට වඩා අඩු කාලයකට අදාල විය.

(ඇ). නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 1994 සිට 2007 වර්ෂය දක්වා පවත්වාගෙන ගොස් තිබුණු ඉන්වෙන්ට්‍රි ලේඛන පරීක්ෂාවේදී, භාණ්ඩ විෂයයන් 12 කට අදාල ඒකක 345 ක අතිරික්තයක් සහ භාණ්ඩ විෂයයන් 19 කට අදාල ඒකක 538 ක ඌණතාවයක් පැවතුණි.

(ඉ). නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේදී ගබඩාවේ පවත්වා තිබු පැරණි තොග ලේඛන සමඟ නව ගබඩා භාරකරුට ලබාදුන් ලිපිද්‍රව්‍ය ශේෂයන් සැසඳීමේදි අයිතම 04 කට අදාලව භාණ්ඩ ඒකක 578 ක අතිරික්තයක්ද අයිතම් 07 කට අදාල භාණ්ඩ ඒකක 2599 ක ඌනතාවයක් ද අනාවරණය විය.

(ඊ). නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පරීක්ෂා කිරීමේදි 2009 වර්ෂයේ මිළදී ගෙන තිබූ රු.70,000 ක් වටිනා ආධාරක සහිත කූඩාරම් 02 ක් 2010 අප්‍රේල් 23 දින බාහිර පාර්ශවයකට ලබාදී තිබුණද, 2011 මාර්තු 31 දින වන විටත් එකී උපකරණ ගබඩාවට ආපසු භාර දි නොතිබුණි.

4.7 අනුකූල නොවීම්
-------------------
(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම
-----------------------------------------------
නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i). ආයතන සංග්‍රහය | | |
| XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | 51,102 | ලේකම්වරයාගේ අවසරය හෝ කුලිය නියම කිරීමට පෙර ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාවක් ලබා නොගෙන හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශිය ලේකම් වෙත ලබාදී ඇති රජයේ නිවාසය සඳහා රු.600 ක නිශ්චිත නිවාස කුලියක් අයකර ගෙන තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි | | |
| මු.රෙ. 104 (1) | 28,000 | හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2009 වර්ෂය තුල අස්ථානගත වී ඇති ඩිජිටල් වර්ගයේ කැමරාවක් සඳහා 25% ක රජයේ ගාස්තු සමඟ වගකිවයුතු පාර්ශවයන්ගෙන් ඊට අදාල අලාභය අයකර ගැනිමට කටයුතු නොකර එම පාඩුව පොත් වලින් කපා හැර තිබුණි. |

| | | |
|---|---|---|
| මු.රෙ. 104 (3) | 320,150 | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් අනතුරකට භාජනය වීමෙන් සිදුවී තිබූ අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් සකස් කර වගකිවයුතු අය හඳුනා ගෙන තිබුණද, සිදුවී තිබූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 115 (ආ). | 15,715 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉකුත් වර්ෂයට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාගේ සහතිකයක් ලබා නොගෙන ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 137 | 714,182 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අවස්ථා 08 කදී අනුමත නොකල වවුචර් 08 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 245(1) | 1,322,155 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අදාලව සහතික නොකරන ලද වවුචර් 10 ක් වෙනුවෙන් ගෙවීම් සිදු කර තිබුණි. |
| මු.රෙ. 237 (අ) | 334,137 | භාණ්ඩ ලැබී ඇති බවට අදාල භාණ්ඩ ලේඛනයෙහි සහතිකයක් ඇමිණිය යුතු වුවද, හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලිපි ද්‍රව්‍ය සඳහා ගෙවීම් කිරීමේදී තොග සහතික ලබාගෙන නොතිබුණි. |
| මු.රෙ. 371 | 589,214 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නොවන නිලධාරින් 05 දෙනෙකුට තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| මු.රෙ.371 (2)(ඇ) | 2,254,573 | තත්කාර්ය අතුරු අග්‍රිමය අදාල කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවද, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ පියවීම දින 03 සිට දින 214 දක්වා ප්‍රමාද කර තිබුණි. |
| මු.රෙ. 571 | 7,023,334 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාළව වර්ෂ 02 කට වැඩි පොදු තැන්පතු ශේෂ 119 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 751 | 601,096 | රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන සියළු භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි සටහන් කළ යුතු වුවද, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් අවස්ථා 04 කදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| මු.රෙ. 780 | 2,023,000 | | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂ 02 තුල වටිනාකම රු.4,597,456 ක් වූ කාර්යාල උපකරණ මිළදී ගෙන තිබියදී නැවත 2010 වර්ෂය තුල රු.2,023,000 ක වටිනාකමැති උපකරණ මිලදී ගෙන තිබූ අතර, ඉකුත් වර්ෂවල මිළදී ගත් කාර්යාල උපකරණ වෙනත් උප කාර්යාල වෙත ලබාදීමට කටයුතු නොකොට මාස 10 ක් යනතුරු කාර්යාල පරිශ්‍රයේ රඳවා ගෙන තිබුණි. |
| මු.රෙ. 1646 | | - | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව එක් වාහනයක දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |

(iii). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

-----------------------------

| | | | |
|---|---|---|---|
| අ. | ස්වදේශ කටයුතු හා පළාත් සභා රාජ්‍ය ලේකම්ගේ 1993 ඔක්තෝබර් 07 දිනැති අංක ර්/2/ඇප දරන චක්‍රලේඛය. | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 10 දෙනෙකු සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අදාල නිලධාරීන් 22 දෙනෙකු විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. |
| ආ. | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | - | වර්ෂ 05 ක් තුල එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් විය යුතු වුවත්, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 11 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| ඇ. | රාජ්‍ය පරිපාලන කළමනාකරණ සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 01/2002 | | හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 02 කට අදාලව රාජ්‍ය ලාංඡනය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නම සටහන් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | භාණ්ඩාගාර චක්‍රලේඛ | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 ජේදය | | ප්‍රාදේශිය ලේකම් කාර්යාල දෙකක පරිගණක 46 කට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |
| (v) | 2003 දෙසැම්බර් 02 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ සභාපතිගේ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් චක්‍රලේඛ අංක 1/2003 | 36,574 | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2008 මැයි සිට සේවයේ නියුතු අනියම් රියදුරකු වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (vi) | 2004 ඔක්තෝබර් 20 දිනැති අංක දරන අතිවිශේෂ ගැසට් නිවේදනය. | 3,750,000 | අඹගමුව ප්‍රාදේශිය ලේකම්වරයා විසින් 2005 පෙබරවාරි 02 දින අත්පත් කරගත් පෞද්ගලික ඉඩම් කැබලි 04 ක් සඳහා 2010 වර්ෂය තුළ ඉඩම් වල තක්සේරු වටිනාකම සහ ඊට අදාල වන්දි මුදල් ගෙවීම් කර ඇතත් එම ඉඩම්වල මායිම් ලකුණ නොතිබූ අතර එම ඉඩම්වල තේ වගාවේන් ලද ආදායම් රාජ්‍ය ආදායමට ගෙන නොතිබුණි. |

(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියා කල අවස්ථා පහත දැක්වේ.

(i). රඳවා ගැනිමේ බදු

(අ). නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අදාලව 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ 153 වගන්තිය යටතේ රු.48,227 ක් වූ රඳවා ගැනිමේ බදු අයකර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ). 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ විධි විධාන අනුව එක් ලිත් මාසයක් තුල රඳවා ගැනීමේ මුළු බදු මුදල් ඊලඟ එළැඹෙන මාසයේ 15 වැනි දිනට ප්‍රථම ප්‍රේෂණය කල යුතු වුවත්, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් මාසයට අදාලව රු.322,278 ක බදු මුදල් 2011 අප්‍රේල් 12 දින දක්වාද දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ii) පිරිවැටුම් බදු.

---------------

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාළව 2001 ජුලි 17 දිනැති මධ්‍යම පළාත් ආදායම් චක්‍රලේඛයේ 03.1 වගන්තිය යටතේ අයකරන ලද රු.26,722 ක් වූ පිරිවැටුම් බදු පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

---------------------------------------

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කිරීමේ දිර්ඝ ප්‍රමාදයන්

-----------------------------------------------------

වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බැංකු ගිණුමකට අදාල බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් දක්නට ලැබිණි. විස්තර පහත දැක්වේ.

| බැංකු ගිණුම | 2011 මාර්තු 31 දින වන විට පිළියෙල කර නොතිබුණු බැංකු සැසඳුම් වලට අදාල වර්ෂය/ මාසය |
|---|---|
| බැංකු ගිණුම (i) | 2009 ජනවාරි සිට 2010 පෙබරවාරි දක්වා |

(ආ) ගැලැපුම් කළ යුතු ශේෂ

---------------------------

2010 දෙසැම්බර් මාසය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් පිලියෙල කර තිබුණු බැංකු ප්‍රකාශවල දැක්වුණු ගැලැපුම් පිලිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලැපුම් පිලිබඳ විස්තරය | කාල විශ්ලේෂණය<br>මාස 6 වැඩි වර්ෂ 1 ට අඩු | <br>වර්ෂ 1ට වැඩි 3 ට අඩු | <br>එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (ii) නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් . | 51,741 | 28,300 | 80,041 |

(ඇ). කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,619,088 ක් වටිනා චෙක්පත් 06 ක් අදාල ආදායකයන්ට ලබා නොදී මාස 3 ක පමණ කාලයක් අත රඳවා ගෙන තිබුණි.

4.9 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් එළඹ තිබුණු ඇතැම් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම.

I. නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල හා ඒ අවට පරිශ්‍රය තුල 2010 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේවාවන් සැපයීම පිණිස පෞද්ගලික සමාගමක් සහ නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් අතර, 2009 සැප්තැම්බර් 23 දින කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව වර්ෂය සඳහා රු.1,079,730 ක් ගෙවීම් කළ හැකි වුවත්, ඒ වෙනුවෙන් රු.1,719,570 ක් ගෙවීම් කිරීම නිසා උක්ත ගිවිසුමට පටහැනිව රු.639,840 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ආ) අධිකාරී බලය නොමැති ගනුදෙනු

1. නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්වරයා පදිංචි රජයේ නිවාසය සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීමට ප්‍රතිපාදන සැලසී නොතිබුණද, එහි භාවිතය සඳහා 260 වැය ශීර්ෂය යටතේ ජායා පිටපත් යන්ත්‍රයක් වෙනුවෙන් රු.107,142 ක් ගෙවීම් කර තිබුණි.

II. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පිසිපි/360/239 හා 1994 මැයි 03 දිනැති ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම්වරයා සඳහා වූ රජයේ නිවාසය සඳහා රජයේ මුදලින් ගෘහ උපකරණ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරය එකඟ නොවන බව දන්වා තිබියදීත් 2010 වර්ෂයේ රජයේ මුදලින් වලපනේ ප්‍රාදේශීය ලේකම්වරයා පදිංචි නිවාසය සඳහා රු.37,165 ක් වටිනා ඇඳක් හා මෙට්ටයක් මිලදී ගෙන තිබුණු අතර, කොත්මලේ ප්‍රාදේශීය ලේකම්වරයා පදිංචි රජයේ නිවාසය සඳහා රු.15,350 ක් වටිනා වැකුම් ක්ලිනර් එකක් මිලදී ගෙන තිබුණි.

(ඇ). අනවසර පදිංචියට ඉඩදීම්.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ඇති රුවන්පුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඒකක කළමනාකරණ කාර්යාල ගොඩනැගිල්ලේ කොටසක වසර 22 කට අධික කාලයක් අනවසරයෙන් පදිංචි වී සිටින රජයේ පාසැලක ගුරු භවතකුගෙන් නිවාස කුලී අයකර ගැනීමට හෝ සන්තකය පවරා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.10 අනාර්ථික ගනුදෙනු

---------------------

දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිලි පරිශ්‍රයේ පිහිටි වෙනත් රජයේ ආයතන 17 කට අදාල විදුලි, ජල පරිභෝජනය ද ඇතුළත්ව රු.1,169,789 ක වටිනාකමැති බිල්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී 260-1-1-0-1103 වැය විෂයයෙන් ගෙවීම් කර තිබුණද, එම ආයතන වෙතින් අදාල මුදල් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

4.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

-----------------------------

i. විමධ්‍යගත මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.531,059 ක් වැය කර මිලදී ගෙන තිබුණු ක්‍රීඩා භාණ්ඩ , ගෘහ භාණ්ඩ, හා සෙවිලි තහඩු බෙදා නොහැර ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක ගබඩා පරිශ්‍රයේ රඳවා තිබුණි.

ii. වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉන්දියානු ණය ආධාර වැඩ සටහන යටතේ ග්‍රාමීය හා නාගරික අඩු ආදායම්ලාභි පවුල් සඳහා 2004 වර්ෂයේ ලබාදුන් රු.8,782,859 ක් වටිනාකමැති ගැල්වනයිස් සෙවිලි රැළි තහඩු 8,600 ක් සහ පැතලි තහඩු 1196 ක් බෙදා දී නොතිබු අතර, ඉන් රු.268,170 ක් වටිනාකමැති සෙවිලි තහඩු 292 ක් 2009 වර්ෂයේ දී අස්ථාන ගතවී තිබුණි.

iii. කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකුගේ විශ්‍රාමික පාරිතෝෂික මුදල වු රු.111,925 ක් 2009 ජනවාරි 09 දින සිට 2011 පෙබරවාරි 20 දින දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

4.12 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක 2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 21 | 07 | - |
| (ii) | තෘතික මට්ටම | 59 | 56 | 03 | - |
| (iii) | ද්විතික මට්ටම | 662 | 569 | 93 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 78 | 68 | 12 | 02 |
| (v) | වෙනත් | - | 02 | - | 02 |
| | උප එකතුව | 827 | 716 | 115 | 04 |

4.13 අභ්‍යන්තර පාලනය

(අ) අභ්‍යන්තර විගණනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

(ආ). කළමනාකරණ හා විගණන කමිටු ක්‍රියාත්මක කිරීම.

1999 නොවැම්බර් 19 දිනැති අංක පිඑෆ්/පිඊ/3/රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය පරිදි ආයතනයේ මූල්‍යමය හා විචක්ෂණභාවය වැඩි දියුණු කිරීම සඳහා විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.